සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

43 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................ ක්‍රිස්තියානි ධර්මය I කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයකට 1,2,3,4,5 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.**

01. ශුද්ධ බයිබලයේ ප්‍රධාන කතෘ දෙවියන් වහන්සේ හා උපකතෘ මිනිසා බව දක්වන්නේ කුමන විශ්ව ලේඛනයේ ද?
    1. වෙහෙසෙන මිනිස්සු 2. වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව
    3. දිව්‍ය සංරක්ෂණය 4. මිනිසාගේ ශ්‍රමය
    5. ගැළවුම්කාරයාගේ මව (.........)

02. ඉශ්‍රායෙල් ගෝත්‍ර ක්‍රමය වෙනුවට රාජ්‍ය පාලන ක්‍රමයක් ඇති කළේ,
    1. සාවුල් රජතුමා 2. දාවිත් රජතුමාය. 3. ජෝෂියා රජතුමා
    4. සලමොන් රජතුමා ය. 5. ශෙදෙකියා රජතුමා ය. (.........)

03. ක්‍රි.පූ. 425 දී නෙහෙමියා ජෙරුසලමට පැමිණ, දෙවන වරට දේශාධිපති වීමෙන් පසුව, සිදුකළ සමාජ ප්‍රතිසංස්කරණයක් වන්නේ,
    1. ජෙරුසලම් පවුර ගොඩ නැගීම. 2. සබත් නිවාඩුව ක්‍රියාත්මක කිරීම.
    3. ගිවිසුම අලුත් කිරීම. 4. විදේශීය භාර්යාවන් පිටමං කිරීම.
    5. සබත් දින වෙළඳම අත් හිටවීම. (.........)

04. 'සෙසරයා' නැමැති නගරය ඉදිකර වරායක් තැනවූයේ,
    1. මහ හෙරෝද් රජතුමා 2. ආණ්ඩුකාර අර්කෙලාවුස්
    3. ආණ්ඩුකාර හොරෝද් ඇන්ටිපස් 4. ජෝෂියා රජතුමා
    5. ආණ්ඩුකාර පොන්තියුස් පිලාත් (.........)

05. චතුර් ශුද්ධාක්ෂරයෙන් නම් කර ඇති යාවේ (YHWH) යන වචනය සිංහල ශුද්ධ බයිබලයේ සඳහන් කරන්නේ,
    1. දෙවියන් වහන්සේ ලෙස ය. 2. සමිඳාණන් ලෙස ය.
    3. ස්වාමීන් වහන්සේ ලෙස ය. 4. දෙව් පියාණන් ලෙස ය.
    5. දෙව් සමිඳාණන් ලෙස ය. (.........)

06. නෝවාගේ කතාව හා ගිල්ගමේෂ් කතාව අතර ඉතා සමීප සම්බන්ධතාවක් ඇති නමුත් ගිල්ගමේෂ් කතාවේ සඳහන් එහෙත් කිතු දහමට නොගැළපෙන ඉගැන්වීම වන්නේ,
    1. පිළිම වන්දනාවයි. 2. බහුදේව වන්දනාවයි. 3. අදේවවාදයයි
    4. මිථ්‍යාදෘෂ්ටිකත්වයයි. 5. මූලධර්මවාදයයි. (.........)

07. එලොහිම් සම්ප්‍රදායට අනුව ආරොන් හා මීරියම් යන දෙදෙනාව හඳුන්වන්නේ,

1. රාජකීයයන් ලෙස. 2. ජනනායකයින් ලෙස.
3. දිවැසිවරුන් ලෙස. 4. ශ්‍රාවකයින් ලෙස.
5. පූජකවරුන් ලෙස. (.........)

08. පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරන්න.

a. ගැලවීම b. ඒක දේව වන්දනාව c. අවංක බව
d. පක්ෂපාතීත්වය e. උත්ථානය f. පාපය

ඉහත සඳහන් කරුණු අතරින් ගිවිසුම් ධර්මය තුළ අඩංගු කරුණු පමණක් සහිත පිළිතුර වන්නේ,

1. a, b, c හා f 2. a, c, d හා f 3. b, c, e හා f
4. b, d,e හා f 5. b,c, d, හා e (.........)

09. ''දෙවියන් වහන්සේ ශුද්ධ බයිබලය තුළින් හැඩ ගස්වන්නේ හා පුහුණු කරන්නේ කිතුනුවන් මිස ගණිතඥයන් නොවේ'' මෙම අදහස ඉදිරිපත් කරන්නේ,

1. ශුද්ධවූ අගුස්තීනු තුමා 2. ශුද්ධවූ ජෙරොම්තුමා
3. ශුද්ධවූ සිරිල් තුමා 4. ශුද්ධවූ ටර්ටුලියන්තුමා
5. ශුද්ධවූ අතනාසියුස්තුමා (.........)

10. ''දෙවියන් වහන්සේ පොළොවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ඔහුගේ නාස් පුඩු තුළට ජීවන හුස්ම හෙළූසේක. (උත්පත්ති 2/7) මෙහි එන දූවිල්ලෙන් යන පදය සඳහා යෙදෙන හේබ්‍රෙව් පදය වන්නේ,

1. අබාද් 2. ෂමාර් 3. ඉෂ් 4. බරිත් 5. අපාර් (.........)

11. පුරාණයේ මිනිසුන් භාවිත කළ, සතුන් දෙපලු කර මුහුණට මුහුණලා ගමන් කිරීමේ පිළිවෙත ආබ්‍රහම්තුමා සමඟ කළ ගිවිසුමේ ද දක්නට ලැබේ. එයින් සංකේතවත් කළේ,

1. ගිවිසුමේ ඇති වගකීම් සහගත බවයි.
2. දෙවියන් වහන්සේ හා මිනිසා අතර වන සමීප සබඳතාවයි.
3. දෙවියන් වහන්සේ හා මිනිසා මුහුණට මුහුණලා හමු වීමයි.
4. ගිවිසුමට දක්වන විශ්වාසවන්ත බවයි.
5. සත්ත්ව ඝාතන සිදු නොකළ යුතු බවයි. (.........)

12. ආබ්‍රහම්තුමා සිය පුත්‍රයා හට භාර්යාවක් සෙවීම සඳහා, මෙහෙකරුවාව පිටත් කර යැව්වේ,

1. කානාන් දේශයට. 2. මෙසපොතේමියාවට. 3. නිනිවයට.
4. මිසරයට. 5. අසිරියාවට. (.........)

13. ''කොහෙන්'' යන හේබ්‍රෙව් පදය සඳහා වඩාත් සුදුසු අර්ථකථනය වන්නේ,

1. දෙවිඳුන් හා ඉශ්‍රායෙල් ජනතාව අතර ඇති විශේෂ සම්බන්ධතාවයි.
2. ජනතාව වෙනුවෙන් දේව සම්මුඛයට යන තැනැත්තා ය.
3. වෙන් කරන ලද ජාතියකි.
4. දෙවියන් වහන්සේගේ සාක්ෂිකරුවන් ය.
5. දෙපාර්ශවයක් අතර ඇති වන එකඟතාවයකි. (.........)

14. බාබෙල්කොත සිද්ධියේදී ශුද්ධ වූ බයිබල කතුවරයා උඩඟු මනුෂ්‍යයාව හාස්‍යයට ලක්කර ඇත්තේ,

1. හුණු බදාම වෙනුවට කීල්තාර භාවිතා කර කොත ගොඩ නැගීමෙනි.
2. කළුගල් වෙනුවට ගඩොල් භාවිත කිරීමෙනි.
3. බබිලෝනියාව අහංකාර නගරයක් ලෙස නම් කිරීමෙනි.
4. කොත බැලීමට දෙවියන් වහන්සේ ස්වර්ගයෙන් බැස වැඩීමෙනි.
5. භාෂාවන් අතර අනවබෝධය ඇති කිරීමෙනි. (.........)

15. පලස්තීනයේ පවතින අඳුරු අසහනකාරී තත්ත්වය වෙනස් වී ඊශ්‍රායෙල් ජනතාවට ප්‍රීතිජනක බලාපොරොත්තුවක් ඇති කරවන දිවැසිවර යෙසායාගේ දිවැස් වැකියක් වන්නේ,
1. අන්ධකාරයෙහි ඇවිද්ද සෙනග මහත් ආලෝකයක් දුටුවෝය.
2. සියොන් පුරඟන ප්‍රීති ප්‍රමෝද වන්න.
3. දාවිත්ගේ රජ පෙළපත නැමැති වෘක්ෂයෙන් රාජාංකුරයක් හට ගන්නේය.
4. කිරි දරුවා නාගයාගේ තුඹස පිට සෙල්ලම් කරන්නේය.
5. තැළුනු බට දණ්ඩක් කඩා දමන්නේ නැත. (.........)

16. ප්‍රඥා සාහිත්‍යයේ ආරම්භය සිදුවූවායයි සිතිය හැකි යුගය වන්නේ,
1. වීරවරුන්ගේ යුගය අවසන් වී රජ යුගය ආරම්භයේදී.
2. ආදිපීතෘවරුන්ගේ මග පෙන්වීම ලැබුණු යුගයකදී.
3. ක්‍රිස්තුස් වහන්සේගේ ආගමනයට පසු යුගයකදී.
4. අධිරාජ්‍යවරු මුල් කිතුණු සභාවට පීඩා කරන යුගයකදී.
5. විප්‍රවාසයෙන් පසුව දිවැසිවරුන් ක්‍රමයෙන් වියැකී යන යුගයකදී. (.........)

17. දෙවියන් වහන්සේගේ ආදරය, මියැඳුණු අතීතය අමතක කර දමා, අනාගතයට මුහුණදීමට සෑම විටම සූදානම්ව සිටින ස්වාමිපුරුෂයකුගේ අසීමිත ආදරයකට සමාන කරන, දිවැසිවරයා වන්නේ,
1. යෙසායා 2. හොසියා 3. ආමොස් 4. ජෙරමියා 5. එසකියෙල් (.........)

18. සැන්හෙඩ්‍රින් සභාවේ සාමාජිකත්වය දරා ඇති ශුද්ධ වූ බයිබලයේ සඳහන් පුද්ගලයන් තිදෙනා වන්නේ,
1. කොර්නේලියස්, සකේවුස්, අන්නාස්
2. අනනියස්, කයිපාස්, සීමෝන් සිරනේවුස්
3. නිකදේමුස්, කොරනේලියස්, සීමෝන් සිරනේවුස්
4. අරමාතියේ ජෝෂප්, නිකදේමුස්, ගමාලියෙල්
5. අන්නාස්, කයිපාස්, අනනියස් (.........)

19. ධර්මශාලා ඇතිවීමට හේතුව වූයේ,
1. යැදුමට පොදු පිරිසක් අවශ්‍ය වූ නිසා.
2. දේව මාලිගයේ දීර්ඝ පිළිවෙත් පැවති නිසා
3. දේව මාළිගාව විනාශ වී තිබුණු නිසා.
4. වත් පිළිවෙත් සිදු කිරීමට අවශ්‍ය වූ නිසා.
5. වාචික සම්ප්‍රදාය ඉදිරියට ගෙනයා යුතු නිසා. (.........)

20. සාම්ප්‍රදායිකව මෝසෙස් තුමාගේ පංච පුස්තකය ආභාෂයෙන් සම්පාදනය වී ඇති නව ගිවිසුමේ කෘතිය ලෙස විශාරදයින් පෙන්වා දෙන්නේ,
1. ශු. මතෙව් සුබාරංචිය. 2. ශුද්ධවූ මාක් සුබාරංචිය
3. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත. 4. එළිදරව්ව පොත.
5. හෙබ්‍රෙව් ලිපිය. (.........)

21. ලාඳුරු රෝගියෙකු සුවකළ අවස්ථාවේ එය කිසිවකුට නොකියන්න යැයි පවසමින් ක්‍රිස්තුන් වහන්සේ එය වළක්වාලූයේ,
1. මෙසියානික රහස හෙළිවීම වැළැක්වීමට.
2. ලාඳුරු රෝගීන් පූජකයා ඉදිරියේ පමණක් පෙනී සිටිය යුතු වූ නිසා.
3. උන්වහන්සේට තවදුරටත් ප්‍රාතිහාර්යය කිරීමට අවශ්‍ය වූ නිසා.
4. ජුදා නායකයින්ගෙන් වන හානිය වළක්වාලීමට.
5. ප්‍රාතිහාර්ය කිරීම උන්වහන්සේගේ ප්‍රධාන අරමුණු නොවූ නිසා. (.........)

22. ප්‍රථම වතාවට ''ක්‍රිස්තියානි'' යන නමින් ශ්‍රාවකයන් හඳුන්වනු ලැබුයේ,
   1. ජෙරුසලමේදී.
   2. සිරියාවේ අන්තියෝකියේදී.
   3. සයිප්‍රසයේ දී.
   4. කොරින්තියේදී.
   5. සිලුකියේදී. (.........)

23. ඊශ්‍රායෙල් ජනතාව පාස්කුව සැමරූ මෙන්ම, ජුදෙව් මාස ක්‍රමයට අනුව නිසාන් නමින් නම්කර ඇත්තේ මෙම මාස දෙක අතර කාලයයි.
   1. ජනවාරි - පෙබරවාරි
   2. මැයි - ජුනි
   3. මාර්තු - අප්‍රේල්
   4. ජුනි - ජුලි
   5. සැප්තැම්බර් - ඔක්තෝබර් (.........)

24. ඊශ්‍රායෙල්හි ප්‍රඥාවන්තයින් ඔවුන්ගේ දෙපා බිම තැබිය හැකි පුද්ගලයින් වූහ. මෙයින් අදහස් කරනුයේ,
   1. ප්‍රඥාවන්තයින් වන්නේ ඉතා මහළු වයසේදී බවයි.
   2. ඉතා අධික ආඩම්බර පුද්ගලයින් බවයි.
   3. ඉතා දිළිඳු පවුල් නියෝජනය කරන බවයි.
   4. අන් අයගේ සිතුම් පැතුම් තේරුම්ගත් පුද්ගලයින් බවයි.
   5. ප්‍රඥාව නිසා දෙවියන් වහන්සේට දුරින් සිටිය අය බවයි. (.........)

25. අප්‍රධානතා වාදය නැමැති දුර්මතය සමඟ පැන නැගුණ වේද භේදය වන්නේ,
   1. ඒරියන්වාදය
   2. එව්ටිකියන්වාදය
   3. මොනිපිටියානුවාදය
   4. නෙස්ටෝරියන්වාදය
   5. පෙලාජියානුවාදය (.........)

26. පස්වන සියවස තුළදී අයර්ලන්තවාසී ගෝත්‍රිකයන් ශිෂ්ට කරවීමට සමත්වූ කිතුනු තාපස දෙපළ වන්නේ,
   1. ශු. බොනිෆස් හා විනිෆ්‍රිඩ් තුමන්
   2. ශුද්ධවූ බෙනඩික් හා පැට්රික්තුමන්
   3. ශුද්ධවූ මෙතෝඩියස් හා සිරිල්තුමන්
   4. ශු. රොමෝල්ඩ් හා බ්රූ තුමන්
   5. ශුද්ධවූ රොබට් බෙලාමියන් හා සයිමන් ස්ටොක් තුමන් (.........)

27. දිව්‍ය පූජාව තුළට ග්‍රෙගෝරියානු සජ්ඣායනා ක්‍රමය නමින් පසුව හැඳින්වෙන්නට වූ නව සංගීත ක්‍රමය ඇතුළත්කරනු ලැබූ තැනැත්තා වන්නේ,
   1. ශාන්ත බෙනඩික් තුමා.
   2. පළමු ලියෝ පාප්තුමා.
   3. මහා ග්‍රෙගරි පාප්තුමා.
   4. ශුද්ධ වූ කොලුම්බා තුමා
   5. මෙලෙස්මාහි රොබට් තාපස තුමා. (.........)

28. ක්‍රි.ව. 1625 දී දුගීන්ට ධර්ම දානය හා පූජකපුහුණුව අරමුනු කොටගෙන ප්‍රංශයේ ආරම්භ කළ නිකාය වන්නේ,
   1. කැපුචින් නිකාය.
   2. ජේසු නිකාය.
   3. කාර්මෙල් නිකාය.
   4. වින්සෙන්තියානු නිකාය.
   5. ශු. පවුලේ නිකාය. (.........)

29. ක්‍රි.ව. 911 දී ලංකාවේ එවකට සිටි රජුගේ ඇමති මණ්ඩලයේ කිතුනුවන් හතර දෙනෙකු සේවය කළ බව සටහන් වන්නේ,
   1. බෙන්ජමින් රබායිගේ සටහන් වල.
   2. ඊ.ආර්. අයර්ටන් නැමැත්තාගේ සටහන්වල
   3. කොස්මස්ගේ සටහන්වල
   4. අබුසයිද්ගේ සටහන්වල
   5. සෙනරත් පරණවිතාන මහතාගේ සටහන්වල (.........)

30. කිතු දහම වැළඳගත් රජ දරුවන් අතර, පෘතුගීසි උදව් පතා කිතු දහම වැළඳ ගත්තද සීතාවක රාජසිංහ රජුගේ ආක්‍රමණ නැවතුණ පසු කතෝලික ධර්මය ප්‍රතික්ෂේප කළ පුද්ගලයා වන්නේ,
   1. ධර්මපාල කුමාරයා.
   2. කරලියද්දේ බණ්ඩාර
   3. ජයවීර බණ්ඩාර
   4. වීර සුන්දර බණ්ඩාර
   5. දොන් ජුවම් යමසිංහ (.........)

31. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමන් විසින් රචිත පද්‍ය කෘති හා ගීත ප්‍රබන්ධ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
   1. දේව වේද පුරාණය, බුදුමුල, ඥානාංජනය
   2. දුක්ප්‍රාප්ති ප්‍රසංගය, ලතෝනි පොත, අඥාන ඖෂධය.
   3. මාතර ප්‍රත්‍යක්‍ෂය, ධර්මෝධ්‍යානය, පසන් පොත
   4. වේද කාව්‍යය, ආනන්ද කලිප්පුව, මංගල ගීතය
   5. භේදකාරයන්ගේ තර්කය, ක්‍රිස්තියානි පල්ලිය, දේව පරිහාරය. (.........)

32. ගරු ජේම්ස්කාටර් දේව ගැතිවරයා ක්‍රි.ව. 1812 දී ලන්ඩනයේ සිට ශ්‍රී ලංකාවට පැමිණ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයෙන් ආරම්භ කළ ධර්මදූත කණ්ඩායම වන්නේ,
   1. බැප්ටිස්ට් ධර්මදූත කණ්ඩායම
   2. ලන්ඩන් ධර්මදූත කණ්ඩායම
   3. වෙස්ලියන් ධර්මදූත කණ්ඩායම
   4. ඇමරිකන් ධර්මදූත කණ්ඩායම
   5. ගැලවීමේ හමුදාවේ ධර්මදූත කණ්ඩායම. (.........)

33. ලංකාවේ ප්‍රථම සිංහල රදගුරුතුමා වන අති උතුම් එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමිපාණන් අයත් රදගුරුපදවිය වන්නේ,
   1. ගාල්ල පදවිය
   2. කොළඹ පදවිය
   3. නුවර පදවිය
   4. කුරුණෑගල පදවිය.
   5. හලාවත පදවිය (.........)

34. කිතුණු දරුවන්ගේ නාම සාන්තුවරයා ලෙස හඳුන්වනු ලබන්නේ,
   1. ශුද්ධ වූ තෝමස් ඇක්වයිනස් තුමා
   2. ශුද්ධ වූ ජෝන් බැප්ටිස්ට් ද ලාසාල් තුමා
   3. ශු. ඉග්නාසියුස් ලොයලා තුමා
   4. අසීසියේ ශු. ප්‍රැන්සිස් තුමා
   5. ශුද්ධ වූ වින්සෙන්තිද පාවුලු තුමා (.........)

35. * නාම සාන්තුවරයා මිකායෙල් අග්‍ර ද්වදූතයාය.
   * ලංකාවේ ක්‍රියාත්මක වන පැරණිම දේශීය පැවිදි නිකාය මෙයයි.
   * ගාල්ලේදී ආරම්භ වී ඇත.

   ඉහත කරුණු වලට අදාළවන පැවිදි නිකාය වන්නේ,
   1. යහපත් එඬේරාගේ පැවිදි නිකාය.
   2. අපෝස්තලික කාර්මෙල් නිකාය
   3. සුරදූතික පැවිදි නිකාය
   4. දයාවේ පැවිදි සොයුරියෝ
   5. දිළිඳුන්ගේ කුඩා සොහොයුරියෝ. (.........)

36. ''ශ්‍රී ලංකාව ස්වෛරී රාජ්‍යයක් බවට පත් කළ යුතු ය.'' යන යෝජනාව ස්ථිර කළ බැතිමත් කතෝලික පුද්ගලයා වන්නේ,
   1. ජේ.ඒ.එල්. කුරේ මහතා
   2. ශ්‍රීමත් ජේම්ස් පීරිස් මහතා.
   3. ඊ.ඩබ්. පෙරේරා මහතා.
   4. ඇල්බට් ඒ වික්‍රමසිංහ මහතා
   5. ජේ.ආර්. ජයවර්ධන මහතා. (.........)

37. ''තම සහෝදරයාට ප්‍රේම නොකරන තැනැත්තාට නොපෙනෙන දෙවිඳුන්ට ප්‍රේම කළ නොහැකි බව නව ගිවිසුමෙහි පෙන්වා දෙන්නේ,
   1. ශුද්ධ වූ පේදුරු තුමා.
   2. ශුද්ධ වූ ලූක් තුමා.
   3. ශු. ජොහාන් තුමා.
   4. ශුද්ධ වූ මතෙව් තුමා.
   5. ශුද්ධ වූ පාවුලු තුමා. (.........)

38. සාමය නගාලීම සම්බන්ධ ශුද්ධ වූ සභාවේ ස්ථාවරය තහවුරු කරනු ලබන ලේඛන දෙකක් වන්නේ,
   1. කිතුණු අධ්‍යාපනය, ශුද්ධ වූ සභාව පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව
   2. මව හා ගුරිවරිය, දේව ප්‍රකාශන පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව
   3. වෙහෙසෙන මිනිස්සු, ආගමික නිදහස පිළිබඳ ප්‍රකාශනය
   4. අතීන්ද්‍රීය ක්‍රිස්තු දේහය, ගිහි ධර්මදූත සේවාවන් පිළිබඳ නියෝගය.
   5. ලෝක සාමය, වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව. (.........)

39. ශ්‍රී ලංකාවේ පැරණිතම ප්‍රොතෙස්තුන්ත සභාව ලෙස හඳුන්වන්නේ,
   1. ලංකා සභාව
   2. ඕලන්ද රෙපරමාදු සභාව
   3. ප්‍රෙස්බිටේරියානු සභාව
   4. දකුණු ඉන්දියානු සභාව
   5. මෙතෝදිස්ත සභාව. (.........)

40. අධිරාජ්‍යයාගේ පිළිම වලට පුද පූජා ඔප්පු කිරීමට හා ඒ පිළිමවලින් නිරූපණය වන්නන් දේවත්වයෙන් පිදීමට කැමැත්ත පළ කරමින් 'ලිබෙලුස්' නම් සහතිකය ලබාගැනීම අනිවාර්ය කරන ලද අධිරාජ්‍ය සමය වන්නේ,
   1. ට්‍රාජන් අධිරාජ්‍ය සමය
   2. ඩෙසියස් අධිරාජ්‍ය සමය
   3. මාකස් අවුරේලියස් අධිරාජ්‍ය සමය
   4. මැක්සිමිනස් අධිරාජ්‍ය සමය
   5. සෙප්ටිමස් සෙවරස් අධිරාජ්‍ය (.........)

41. * තර්කවේදීන් අතර දක්ෂතම තර්කවේදියා මෙතුමාය.
   * දෙවන ශත වර්ෂයේ ප්‍රසිද්ධම සභා පියවරයා මෙතුමාය.
   * ශු. සභා මාතාව ජූනි 01 මෙතුමාගේ මංගල්‍ය පවත්වන්නීය.

   ඉහත කරුණු වලට අදාළවන සභා පියවරයා වනුයේ,
   1. ශුද්ධ වූ ජෙරොම් තුමා.
   2. ශුද්ධ වූ අගුස්තීනු තුමා
   3. ශුද්ධ වූ තෝමස් ඇක්වයිනස් තුමා.
   4. ශුද්ධ වූ ජස්ටින් තුමා
   5. ශුද්ධ වූ සිරිල් තුමා (.........)

42. අපොලොජිස්ත ලේඛකයන් වශයෙන් හඳුන්වනු ලබන්නේ,
   1. අපෝස්තුළුවරුන්ට ඉතා කිට්ටුවෙන් නෑකම් කියන පියවරු.
   2. නව ගිවිසුමේ ඉගැන්වීම් සම්බන්ධ කර ලිපි ලියූ පියවරු
   3. මහා සභා පියවරු අතරට ගැනෙන ලේඛක පියවරු
   4. අපෝස්තලික යුගය අවසන්වීමත් සමඟ සභාවට එක්වූ පියවරු
   5. කිතුනු ධර්මයට එරෙහිවූ දුර්මතවලට එරෙහිව, ප්‍රතිචාර දැක්වූ පියවරු. (.........)

43. එකොළොස්වන සියවස තුළ සභා ඉතිහාසයේ සිදුවූ අවාසනාවන්ත සිදුවීම වනුයේ,
   1. පෙරදිග හා අපරදිග සභා භේදයයි.
   2. කුරුස යුද්ධ ඇතිවීම.
   3. තාපසාරාම වල අධ්‍යාත්මිකත්වය දුර්වල වීම.
   4. පිරිහුණු පාප්වරුන්ගේ නායකත්වය ලැබීම.
   5. ගෝත්‍රික ජනයා සභාවට තර්ජන එල්ලකිරීම හා යටත් කර ගැනීම. (.........)

44. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර අසහාය මැදිහත්කරුවාණන් ක්‍රිස්තුන් වහන්සේ බව පෙන්වා දෙන නවගිවිසුමෙහි ලිපිය වන්නේ,
   1. ජාකොබ් 2. 1 පේදුරු 3. ගලාති 4. හෙබ්‍රෙව් 5. II ජොහාන් (.........)

45. ''මා ඔබට ඉගැන්වූ මේ පිළිවෙතම ස්වාමීන් වහන්සේගෙන්ම ලැබුවෙමි'' ශුද්ධ වූ පාවුලු තුමා පවසන මෙම වදන අප අවබෝධ කරගත යුත්තේ,
   1. උත්ථානවූ ක්‍රිස්තුන් වහන්සේ පාවුලු තුමාගේ සිත් හැරීම සිදුවූ අවස්ථාවේ අනාවරණය කළ දෙයක් ලෙස.
   2. ශුද්ධ වූ පාවුලු තුමා අපෝස්තුළුවරුන් වෙත ගොස් ඉගෙන ගත් දෙයක් ලෙස.
   3. තම ධර්මදූත චාරිකා තුළ ලැබූ අනාවරණයක් ලෙස.
   4. ජේසුස් වහන්සේ දර්ශනයකින්, ස්වප්නයකින් කළ අනාවරණයක් ලෙස.
   5. අපෝස්තුළුවරුන් විසින් පිහිට වූ සභාවක ජන වන්දනාව ඇසුරෙන් ලැබූවක් ලෙස. (.........)

46. කැන්ටබරියෙහි ශුද්ධ වූ ඇන්සලම් තුමාට අනුව දේව ධර්මය යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
   1. දෙවියන් වහන්සේ පිළිබඳ විද්‍යාවකි.
   2. අවබෝධය සොයා යන ඇදහිල්ලකි.
   3. හදවතින් නොව බුද්ධියෙන් දෙවියන් දැකීමකි.
   4. ස්වර්ගය පතා කරන අධ්‍යාත්මික ගුණ වගාවකි.
   5. ශුද්ධ වූ ලියවිල්ල විචාර බුද්ධියෙන් හැදෑරීමකි. (.........)

47. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව සමාප්තියට පත්කළ සුදතුම් පියා වන්නේ,
   1. 6 වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා.
   2. 2 වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා
   3. 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා.
   4. 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා.
   5. 9 වන පියුස් ශුද්ධෝත්තම පියතුමා. (.........)

48. ශුද්ධ වූ ලියවිල්ලට අනුව ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ ලෙසත්, ගැළවුම් කරුවාණන් ලෙසත් විශ්වාසය ප්‍රකාශ කරන මිත්‍රශීලී ව්‍යාපාරය වන්නේ,
   1. ඇන්ග්ලිකානු සහ පෙරදිග සභා සංගමය
   2. ලෝක ලුතරානු සම්මේලනය
   3. අන්තර් නිකායික සහයෝගීතා සංවිධානය.
   4. එංගලන්ත රෝමානු කතෝලික අන්තර් ජාතික කොමිසම.
   5. මෙතෝදිස්ත හා ප්‍රතිසංස්කරණවාදී සංවිධානය. (.........)

49. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයෙන් පසුව අපෝස්තුලුවරුන් වෙත එම සුපුවත රැගෙන යාමේ ගෞරවය හිමිවන්නේ,
   1. මන්දලාහි මරියාට.
   2. ශුද්ධ වූ පේදුරු තුමාට.
   3. ශු. ජොහාන් තුමාට.
   4. ක්‍රිස්තුන් වහන්සේගේ මෑණියන්ට.
   5. ශුද්ධ වූ තෝමස් තුමාට. (.........)

50. කිතුනුවකු වීම සඳහා ජාතිය වැදගත් නොවන බව ශුද්ධවූ පාවුලු තුමා තේමා කර ඇති ලිපිය වන්නේ,
   1. 1 කොරොන්ති ලිපිය
   2. එපීස ලිපිය
   3. රෝම ලිපිය
   4. පිලමොන් ලිපිය.
   5. ගලාති ලිපිය (.........)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

43 S II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

Third Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

# ක්‍රිස්තියානි ධර්මය II

කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

## I කොටස

01. (i) සාමුවෙල් හා රාජාවලිය යන ග්‍රන්ථවල සඳහන් පැරණි දිවැසිවරු දෙදෙනෙක් නම් කරන්න.
 (ii) පැරණි දිවැසිවරුන්ගේ දූත මෙහෙවර තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් නම් කරන්න.
 (iii) (යෙසායා 11/1-9) අනුව සාම රාජ්‍යය පිළිබඳ දිවැසිවරයා ඉදිරිපත් කරන ප්‍රතිඵල තුනක් ලියන්න.
 (iv) සමිඳුන්ට ප්‍රියමනාප ලෙස අරුත්බර ජීවිතයක් ගත කිරීමට ප්‍රඥාව පිටුවහලක් වේ. ඒ අනුව ඔබ ක්‍රියාකරන ආකාරය කරුණු හතරකින් පෙන්වා දෙන්න.

02. (i) මතෙව්තුමා ඉදිරිපත් කරන දේශනා දෙකක් ලියන්න.
 (ii) භාග්‍ය අට සඳහන් දේශනාවේ පරමාර්ථ දෙකක් ලියන්න.
 (iii) ජාතීන්ගේ විනිශ්චය දවස පිළිබඳ උපමාවෙන් යමකුගේ සදාකාලික ඉරණම තීරණයවන ආකාර තුනක් ලියන්න.
 (iv) ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ භාග්‍ය අට දේව ප්‍රේමය උරුමකර ගත හැකි ආර්ය අෂ්ඨාංගික මාර්ගයක් ලෙස හඳුන්වා දෙයි. කිතුනු ජීවිතයේ භාග්‍යවන්තකම උරුම කරගැනීමට ඔබ තුළ ගොඩනගා ගතයුතු ගුණාංග හතරක් ලියන්න.

03. (i) පෘතුග්‍රීසීන්ගේ පැමිණීමෙන් පසු මෙරට ධර්මදූත සේවය සඳහා පැමිණි නිකායන් දෙකක් ලියන්න.
 (ii) ධර්මදූතවරුන් කළ සේවාවන් දෙකක් ලියන්න.
 (iii) පෘතුග්‍රීසි ධර්මදූත වරුන්ගේ ප්‍රයත්නය සාර්ථක කර ගැනීමට හේතුවූ කරුණු තුනක් ලියන්න.
 (iv) ඔබ කිතුනු සිසු දරුවකු ලෙස ශුද්ධ වූ ජුසේ වාස් පියතුමාගේ ජීවිත ආදර්ශය අනුව ධර්මදූත සේවයේ ක්‍රියාකරන ආකාර හතරක් ලියන්න.

## II කොටස

04\. (i) ශුද්ධ බයිබලයේ ප්‍රථම පොත වන උත්පත්ති පොතේ පළමු පරිච්ඡේද 11 හි අඩංගු වන්නේ ඓතිහාසික හෝ විද්‍යාත්මක කරුණු නොව දේව ධාර්මික ඉගැන්වීම් සම්ප්‍රදායක් බව පෙන්වාදීම කරුණු පහක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ii) දේව ප්‍රේමයට විරුද්ධව පව් කළ මිනිසා සහෝදර ප්‍රේමයට විරුද්ධව කටයුතු කළ ආකාරය උත්පත්ති පොතේ සැලැස්ම තුළ මනාව පෙන්වා දෙයි. ඒ පිළිබඳව කරුණු පහක් ඔස්සේ පෙන්වාදී පාපයේ වර්ධනය ප්‍රතික්ෂේප කිරීමට කිතුනු ඔබ ක්‍රියාකළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

05\. (i) ශුද්ධ ලියවිල්ල ලියූ මිනිස් කතුවරුන්ගේ මනස ශුද්ධාත්මයාණන් වහන්සේ ශුද්ධ ලියවිල්ල ලියන අවස්ථාවේ විනිවිද යාම තුළ ග්‍රන්ථාරූඪ වීමට මුල් වූ අරමුණු ලියා එය කිතුනු ජීවිතයට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

(ii) දෙවියන් වහන්සේගේ ගැලවීමේ සැලැස්ම පිළිබඳ අනාවරණය, මෝසෙස්තුමාගේ උපත සිදුවීමත්, දෙවියන් වහන්සේගේ ආධිපත්‍ය පාරාවෝ හා මිසර වැසියන් හට ප්‍රකාශ කිරිමත්, ඔවුන් විසින් දෙවියන් වහන්සේගේ ආධිපත්‍යය පිළිගැනීමත් කරණ කොටගෙන, ඊශ්‍රායෙල් ජනතාවට නික්ම යාමට පසුබිම සකස් වූ අයුරු කරුණු පහක් ඔස්සේ පෙන්වා දෙන්න.

06\. (i) ජොහාන් සුවිශේෂය තුළ ක්‍රිස්තුන් වහන්සේගේ ස්වයං අනාවරණයේ ප්‍රකාශන පහක් ඉදිරිපත් කරමින් උන්වහන්සේගේ දේව පුත්‍රභාවය එළි දැක්වූ ආකාරය පෙන්වා දී මෙම සුභාරංචිය ලිවීමේ පරමාර්ථය පැහැදිලි කරන්න.

(ii) වර්තමාන සමාජය තුළ ජීවත් වන කිතුනු ඔබ දෙවියන් වහන්සේගේ අනාවරණය තේරුම් ගනිමින් සුභාරංචිය තුළ තම දිවි පැවැත්ම අන් අයට සුභාරංචියක්වන ලෙස ගත කරන අයුරු කරුණු පහක් ඔස්සේ පැහැදිලි කරන්න. (10 x 2 = 20)

07\. (i) ශුද්ධාත්ම ආගමනය ශුද්ධ වූ සභාවේ ආරම්භය ලෙසත් නව යුගයක ආරම්භය ලෙසත් හැඳින්විය හැකිය. මෙය වචන 150 කින් පමණ පැහැදිලි කරන්න.

(ii) මුල් කිතුණු සභාවේ ලක්ෂණ නම්කර එය ඔබගේ කිතුනු ඒකකය තුළ ක්‍රියාවට නඟන ආකාරය කරුණු පහක් ඔස්සේ පැහැදිලි කරන්න. (10 x 2 = 20)

08\. (i) මධ්‍යතන යුගයේ දොළොස්වන සියවස තුළ කිතුනු සභාව මුහුණ දුන් අවාසනාවන්ත සිදුවීම නම්කර, එම සිදුවීම නිසා එකළ කිතුණු සභාව තුළ ඇතිවූ ප්‍රතිඵල කරුණු පහක් ඔස්සේ පෙන්වා දෙන්න.

(ii) තරුණ කිතුනු සිසු දරුවෙක් ලෙස වර්තමානයේ අප මුහුණ පා සිටින තත්ත්වය තේරුම්ගෙන අප රට තුළ ජාතික සමගිය හා ආගමික සංහිඳියාව ගොඩනැගීමට ඔබ දායක වන ආකාරය කරුණු පහකින් විස්තර කරන්න.

# තෙවන වාර පරීක්ෂණය - 2019
# ක්‍රිස්ත්‍රියානි ධර්මය - 13 ශ්‍රේණිය
# I පත්‍රය
# පිළිතුරු

| | | | | |
|---|---|---|---|---|
| **01.** - 3 | **11.** - 4 | **21.** - 1 | **31.** - 4 | **41.** - 4 |
| **02.** - 4 | **12.** - 2 | **22.** - 2 | **32.** - 1 | **42.** - 5 |
| **03.** - 5 | **13.** - 2 | **23.** - 3 | **33.** - 5 | **43.** - 1 |
| **04.** - 1 | **14.** - 4 | **24.** - 4 | **34.** - 2 | **44.** - 4 |
| **05.** - 2 | **15.** - 1 | **25.** - 1 | **35.** - 3 | **45.** - 5 |
| **06.** - 2 | **16.** - 5 | **26.** - 2 | **36.** - 1 | **46.** - 2 |
| **07.** - 3 | **17.** - 2 | **27.** - 3 | **37.** - 3 | **47.** - 1 |
| **08.** - 2 | **18.** - 4 | **28.** - 4 | **38.** - 5 | **48.** - 3 |
| **09.** - 1 | **19.** - 3 | **29.** - 4 | **39.** - 2 | **49.** - 1 |
| **10** - 5 | **20.** - 1 | **30.** - 3 | **40.** - 2 | **50.** - 5 |

(ලකුණු 1X2=100)

# ක්‍රිස්ත්‍රියානි ධර්මය - 13 ශ්‍රේණිය.
# II පත්‍රය
## I කොටස

01. (i) එලියා, එලිෂා, නාතාන්, හුල්දා, අභියා (ලකුණු 2x1=2) (12 ගු.මා. 3.1 නිපුණතා මට්ටම)

(ii) ධ්‍යානයට සම වැදීම, කණ්ඩායම් වශයෙන් මෙහෙවර යෙදීම, තම දූත මෙහෙවර සනාථ කිරීම සඳහා හාස්කම් කිරීම. (ලකුණු 2x2=4) (12 ගු.මා. 3.1 නිපුණතා මට්ටම)

(iii) * ප්‍රඥාව - යුක්ති සහගතව හා නිවැරදිව ජීවිතයට මුහුණදීමේ හැකියාව.
* නුවණ - දේව කැමැත්ත තෝරා බේරා ගැනීමේ හැකියාව.
* අනුශාසනා බුද්ධිය - තව කෙනෙකුටහරි මග පෙන්වීමේ හැකියාව.
* බලය - මෙසියස් වහන්සේ තුළ පිහිටුවන බලය.. දේව අභිමතය කරන්නට පෙළඹවීම.
* දැනගැනීම - අත්දැකීම් තුළින් ලබා ගන්නා අවබෝධයයි.
* දේව ගරු බිය - දේව අණපනත් පිළිපැදීමෙන් දෙවියන් වහන්සේට ගරුබිය දැක්වීම.
(ලකුණු 2 x 3 = 6) (12 ගු.මා. 3.1 නි.ම)

(iv) * ජීවිතය සාර්ථක ලෙස ගතකිරීමට මගපෙන්වීම. * දැහැමි ලෙස දිවි ගෙවීමට මගපෙන්වයි.
* සමාජ පරිපාලනයටද මග පෙන්වයි. * ජීවිතයේ අරුත හා සීමාවන් අවබෝධ කරදෙයි.
ඉහත කරුණු සම්බන්ධ කරගෙන ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 2 x 4 = 8)
(12 ගු. මා 3.3 නි.ම) (මුළු ලකුණු 2+4+6+8=20)

02. (i) කන්ද උඩ දේශනය, ධර්මදූත සේවය පිළිබඳ. උපමා පිළිබඳ දේශනය ශුද්ධ වූ සභාව හා එහි අධිකාරිත්වය පිළිබඳ දේශනය, යුගාන්තය පිළිබඳ දේශනය. (ලකුණු 2 x 1=2) (12 ගු.ම. 5.1 නි.ම)

(ii) * ශ්‍රාවකයින්ගේ ධර්මිෂ්ඨකම විනයධරයින්ගේ හා පරිසිවරුන්ගේ ධර්මිෂ්ඨකම් අභිබවා යා යුතු බව. * ජේසුස් වහන්සේ නව මෝසෙස් ලෙස නව කන්දක් මත නව ව්‍යවස්ථාවක් දානය කරන බව. * පැරණි ව්‍යවස්ථාව සම්පූර්ණ කර නව ව්‍යවස්ථාවක් දානය කරන බව. * දේව රාජ්‍යයට ඇතුළු වීමට කැමති අය පොළොවේ ලවණ මෙන්ද ලෝකයේ ආලෝකය මෙන්ද ක්‍රියාකළ යුතු බව. (ලකුණු 2x2=4) (12 ගු.ම. 5.1 නි.ම.)

(iii) කුස ගින්නේ පෙළෙන්නන්ට, අනාථ වූවන්ට, සරණාගතයන්ට රෝගීන්ට හා සිරකරුවන්ට පිහිට වූ ආකාරය ගැන ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 2 x 2 = 4) (12 ගු.ම. 5.1 නි.ම.)

(iv) දිළිඳුකම, ශෝකය, නිහතමානීත්වය, යුක්ති ගරුක බව, දයාව, පිරිසිදු සිත, සාමය හා යුක්තිය උදෙසා පීඩාවිඳීම වැනි ගුණාංග තුළින් කිතුණු ජීවිතයේ භාග්‍ය වන්නකම ගොඩනගා ගන්නා ආකාරය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2x4=8) (12 ගු.මා. 5.1 නි.ම.) මුළු ලකුණු (2+4+6+8=20)

03. (i) ජේසු නිකාය. අගුස්තීනු නිකාය, දොමිනිකාන නිකාය, ප්‍රැන්සිස්කාන නිකාය.

(ලකුණු 2x1=2) (13 ශු.මා. 4.2 නි.ම.)

(ii) අධ්‍යාපනය, අනාථ දරුවන් රැකබලා ගැනීම, රෝගීන්ට උපස්ථාන කිරීම, මහලු අය රැකබලා ගැනීම, කාර්මික පාසල් ආරම්භ කිරීම, පුණ්‍ය ආයතන පවත්වාගෙන යෑම. (ලකුණු 2 x 2 = 4) (13 ශු.මා. 9.2 නි.ම.)

(iii) * ධර්මදූතවරුන්ගේ දැඩි කැපවීම හා උද්යෝගය.
* ධර්ම ප්‍රචාරය කිරීම ධර්ම දූතවරුන් අනුගමනය කළ ධර්ම ප්‍රචාර ක්‍රම.
* ධර්මදූතයින්ගේ සරල චාම් ජීවිත රටා හා ආදර්ශමත් දිවි පැවැත්ම.
* කුල භේද නොතැකීම * ධීවර ජනතාවට ඉතා සමීප වීම.(ලකුණු 2 x 3 =6) (13 ශු.මා. 9.2 නි.ම.)

(iv) සරල දිවි පැවැත්ම (අල්පේච්ඡ ජීවිතය), දැඩි කැපවීම හා උද්යෝගය, අභියෝගවලට මුහුණ දීම, නොසැලෙන අචල විශ්වාසය, නායකත්වය, නිර්භීතකම මෙවැනි කරුණු ඇතුළත් කරමින් ක්‍රියාකරන ආකාරය ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 2x4=8) (13 ශු.මා. 9.3 නි.ම.)

## II කොටස

04. (i) * විද්‍යාවේ පරමාර්ථය මිනිසාගේ ගැලවීම පිළිබඳව ඉගැන්වීම නොවූවද ධර්මයේ අරමුණු මිනිසාගේ ගැලවීමය.
* දෙවියන් වහන්සේ ශුද්ධ බයිබලය තුළින් හැඩ ගස්වන්නේ හා පුහුණු කරන්නේ කිතුනුවන් මිස ගණිතඥයන් නොවන බව ශුද්ධ වූ අගුස්තිනුතුමාගේ ප්‍රකාශය.
* විශ්වයේ ආරම්භය විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් රචනා කළානම් මිනිසාට තේරුම් ගැනීමට නොහැකිවීම.
* ශුද්ධ බයිබලයේ පරමාර්ථය මැවිල්ල සිදු වූ ආකාරය වාර්තා කිරීම නොව මැවිල්ලේ කතුවරයාණන් දෙවියන් වහන්සේ බව පසක් කිරීම.
* මිනිසාගේ සර්වකාලීන ප්‍රශ්න කීපයකට පිළිතුරු දීමට විවිධ උපමාත්මක කතා පුවත් යොදා ගැනීම.. මෙවැනි කරුණු අනුව පැහැදිලි කර ඇත්නම් ලබා දෙන්න. (ලකුණු 10) (12 ශු.මා. 2.2. නි.ම)

(ii) * දෙවියන් වහන්සේ ආදම්ට අවවාද කළා සේ මෙහිදී කායින්ට අවවාද කරන සේක.
* ආදම් මෙන්ම කායින්ද දේව අවවාදයට පිටුපා දෙවියන් වහන්සේට විරුද්ධව පව් කරයි.
* දෙවියන් වහන්සේ ආදම්ගෙන් මෙන්ම කායින්ගෙන්ද ප්‍රශ්නකර දඬුවම් නියම කළසේක.
* දෙවියන් වහන්සේ ආදම්ට හා කායින්ට කරුණාව දක්වා ඔවුන්ගේ සහයට පැමිණෙන සේක.
ඉහත කරුණු ඇතුළත්ව පැහැදිලි කර තිබීමත්, පාපයේ වර්ධනය ප්‍රතික්ෂේප කිරීමට සිසුවා ක්‍රියා කළයුතු ආකාරය පැහැදිලි කර ඇති කරුණු අනුව ලකුණු ලබාදෙන්න.

(ලකුණු 10) (12 ශු.මා. 2.2. නි.ම.) (මුළු ලකුණු 10 x 2 = 20)

05. (i) අරමුණු - ඉගැන්වීමට, දුර්මත දුරුකිරීමට, හික්මවීමට ධර්මිෂ්ට ජීවිතයක් ගතකිරීමට උපදෙස් දීමට.
ඉහත සඳහන් කරුණු කිතුනු ජීවිතයකට වැදගත් වන අයුරු ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න.

(ලකුණු 10) (12 ශු.මා. 2.1 නි.ම.)

(ii) * පීඩන සමයේ මොසෙස්තුමාගේ උපත සිදුවීම. * වසංගත දහය
* දිව්‍ය සංරක්ෂණය හා කැඳවීම ලැබීම. යන කරුණු ඔස්සේ සිසුවා පෙන්වාදීමටගෙන ඇති කරුණු අනුව ලකුණු ලබාදෙන්න. (ලකුණු 10) (12 ශු.මා. 2.2. නි.ම.) (මුළු ලකුණු 10 x 2 = 20)

06. (i) ජීවනදායක භෝජනයමම වෙමි. (ජොහාන් 6/25) ලෝකයේ ආලෝකය මම වෙමි (ජොහාන් 8/12) බැටළුවන්ගේ දොරටුව මම වෙමි. (ජොහාන් 10/7) යහපත් බැටළු එඬේරා මම වෙමි. (ජොහාන් 10/14) පුනර්ජීවනයද ජීවනයද මම වෙමි. (ජොහාන් 11/25) මාර්ගයද සත්‍යයද ජීවනයද මම වෙමි. (ජොහාන් 14/6) සැබෑ මිදිවැල මම වෙමි. (ජොහාන් 15/1)
ප්‍රධාන මුල්‍ය පරමාර්ථය කිතු බැතියන්ගේ අධ්‍යාත්මික හා ආගමික අවශ්‍යතා සපුරාලීමය.
ක්‍රිස්තුස් වහන්සේගේ මෙසියානු අනන්‍යතාවය තහවුරු කිරීම. මෙසියස්තුමා පිළිබඳ ජුදෙව්වරු අතර පැවැති වැරදි මත දුරු කරලීම, ඇදහිල්ල තුළ දිරිමත්කිරීම. ඉහත සඳහන්කරුණු අනුව පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 10) (12 ශු.මා. 2.2. නි.ම.)

(ii) * දේව රාජ්‍යය ලබාගැනීම පිණිස අප සතු සැමදේම අතහැර දැමීමට සූදානම්ව සිටිය යුතුය.
* දේව රාජ්‍ය උරුම කරගත හැකි අවස්ථාවන් උදාවූ විට ඒවා පැහැර නොහැරිය යුතුය.
* මෙතෙක් අපට ඉතා සමීපව තිබූ නමුත් හඳුනානොගත් දේවරාජ්‍ය අප අවබෝධ කරගත යුතුය.
* ලෞකික අවශ්‍යතා නිසා කැඳවීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.
* විවිධාකාරයෙන් කැඳවීම ලැබෙන මාර්ග ඇත. ඒවා හඳුනාගත යුතුය.
සිසුවා ලියා ඇති කරුණු ගැන සලකා බලා ලකුණු ලබාදෙන්න. (ලකුණු 10) (මුළු ලකුණු 10 x 2 = 20)

07. (i) ශුද්ධාත්ම ආගමනය/ශුද්ධ වූ සභාවේ උපන් දිනය පෙන්තකොස්ත දිනය, ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානයෙන් පසු නව යුගයක ආරම්භය බව, ශුද්ධ වූ සභාව ඉදිරි ගමන ශුද්ධාත්ම බලය මත සිදුවන බව, අභියෝග ජය ගැනීමට ශක්තිය මඟපෙන්වීම බව.
ඉහත කරුණු උපයෝගී කර ගනිමින් සිසුවා පැහැදිලි කර ඇති කරුණු අනුව ලකුණු ලබාදෙන්න.
(ලකුණු 10) (12 ශ්‍රේ.මා. 7.1 නි.ම.)

(ii) ඉගැන්වීම, සහභාගිකම, රොටීකැඩීම, යාච්ඤාව හා සියල්ල පොදුවේ තබා ගැනීම ඉහත කරුණු උපයෝගී කර ගනිමින් කිතුනු ඒකක තුළ ක්‍රියාවට නඟන ආකාරය ලියා ඇති කරුණු අනුව ලකුණු ලබාදෙන්න.
(ලකුණු 10) (13 ශ්‍රේ.මා. 7.1 නි.ම.)

08. (i) කුරුස යුද්ධය
* සභාවේ අධ්‍යාත්මික නිදහස බාහිර බලවේගවලින් රැකගැනීම සඳහා පාප්වරුනට යුධ වැදීමට සිදුවීම.
* අධ්‍යාත්මික අරමුණු පෙරදැරි කරගෙන යුධ වැදුණත් ලෞකික සැප සම්පත් රැස් කරගැනීමට හා ඉන් ශුද්ධ වූ සභාව පෝෂණය කිරීමට ක්‍රියාකළ බවද ඉතිහාසය සාක්ෂි දරයි.
* විශාල ජීවිත ගණනක් අහිමි වීම.
* ග්‍රීක ආදිපීතෘවරයා සිටි ස්ථානයෙන් ඉවත් කිරීමට හැකිවීම. සභාභේදය වර්ධනය කිරීමට ඉවහල් වූ කරුණක් වීම.
* ජෙරුසලම අත්පත් කර ගැනීමට හැකිවීම.
* කුරුස යුද්ධ තුනකට මුහුණ පෑමට සිදුවීමත් සියලු කුරුස යුද්ධ මැද සභාභේදය වඩවඩා උත්සන්න විය.
(ලකුණු 10) (13 ශ්‍රේ.මා. 8.1 නි.ම.)

(ii) සිසුවා ලියා ඇතිකරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)
(මුළු ලකුණු 10x 2 = 20)